**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආරෝග්‍යශාලා මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආරෝග්‍යශාලා මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරෝග්‍යශාලා මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.218,607,966 ක්වූ වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතුකර නොතිබුණි. | මෙම වත්කම් ප්‍රත්‍යාගණනය (Revaluation) කිරීම සඳහා 2020 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණ අංශය වෙත දැනුම් දී ඇති බව, රටේ පැවතුණ Covid වසංගත තත්වයන් සහ දැනට රටේ පවතින අර්බුදකාරී තත්ත්වය සමඟ මෙම කාර්ය සඳහා නිලධාරී මණ්ඩලයක් යෙදවීමට අපහසු බව, වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් ඒ පිළිබඳ දැනුම සහිත නිලධාරීන් සම්බන්ධ කර ගැනීමේ අපහසුතාවයක් ඇති බව හා මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් එම වත්කම් වලට අදාළ වර්ෂයේ ක්ෂය වියදම රු.148,000ක් වැඩියෙන් ගණනය කිරීම නිසා වර්ෂයේ අතිරික්තය ඉහත අගයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2022 වර්ෂයේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ 7 වගන්තිය | ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීදුවේ පිහිටි ඉඩමේ අයිතිය 2022 මැයි 31 දින වන විටත් ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ ඇති ඉඩම් අයිතිය ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව, ඒ අනුව අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු සඳහා නීතිඥයින් වෙත අදාළ ලේඛන භාරදී ඇති බව, නීතිමය අවශ්‍යතාව වෙනුවෙන් මෙම පවරා දීමට විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් පදනමේ කැමැත්ත ප්‍රකාශ කර ලිපියක් ඉල්ලා ඇති බව, රෝහල් සභාපතිනිය විදේශගතව ඇති බැවින් ඇය පැමිණි විගස එම ලිපිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව හා එම ලිපිය ලැබුණු විගස අදාළ පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඉඩමේ අයිතිය ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරාගැනීම කඩිනමින් කළ යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි පිළියෙල කර නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර ගැනීම සඳහා දැරීමට සිදුවන වියදම ඉතාමත් අධික බව, මේ අවස්ථාවේ එය රෝහලට දැරිය නොහැකි බව හා ජයවර්ධනපුර රෝහලේ දැනට සකස් වෙමින් පවතින බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අවසන් වූ පසු එහි පිටපතක් ලබා ගෙන විජය කුමාරතුංග අනුස්මරණ රෝහලට අදාළ වන පරිදි සකස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 හා 2020 පෙබරවාරි 21 දිනැති අංක 01/2020 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛ | බඳවාගැනීමේ පටිපාටි පිළියෙල කර අදාළ පාර්ශව වෙතින් අනුමැතිය ලබා ගෙන ඇත්නම් පමණක් අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු නොවන නමුත්, රෝහල් කාර්යමණ්ඩලය සඳහා බඳවාගැනීමේ පටිපාටි පිළියෙල කර නොතිබියදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 25 දෙනෙකු ස්ථිර හා අනියම් පදනමින් බඳවාගෙන තිබුණි. | බඳවා ගැනීමේ පටිපාටියක් රෝහලට මේ වන විට නොමැති නමුත් ආයතනයේ පුරප්පාඩු පිරවීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අදාළ තනතුරු (Carder) අනුමත කරගැනීමෙන් පසු රෝහලේ පවතින පුරප්පාඩු සඳහා සේවකයින් බඳවාගෙන ඇති බව හා එම පුරප්පාඩු සඳහා බඳවා ගන්නා විට නැවත නැවතත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කිරීම අවශ්‍ය නොවන බව. | කළමනාකරණ සේවා චක්‍රලේඛවලට අනුකූලව තනතුරු අනුමත කර ගැනීමට පමණක් නොව තනතුරු පුරප්පාඩු පිරවීමටද එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබුණු 2006 මැයි 10 දිනැති අංක 02-84/2006 දරන හා 2001 ඔක්තෝබර් 30 දිනැති අංක 02-117/2001 දරන පොදු චක්‍රලේඛ ලිපි | රාජකාරී වේලාවෙන් පරිබාහිරව සිදුකරනු ලබන පරීක්ෂණ සඳහා නිදර්ශක දීමනා ගෙවිය හැකි නමුත් ඊට අනුකූල නොවන ලෙස හා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත පමණක් සාමාන්‍ය රාජකාරී කාලය තුළ සිදුකර තිබුණු පරීක්ෂණ සඳහා නිලධාරීන් 10 දෙනෙකු වෙත රු.45,550 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2021 ජුලි මස සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ගෙවීම් සිදු කරන ලද අතර පසුව නැවතත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2021 ඔක්තෝබර් 01 දින සිට එම ගෙවීම නවතා ඇති බව. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,414,950 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.73,706,951 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.80,121,901 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් හා වෙනත් ආදායම් රු.64,308,379 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2017 දෙසැම්බර් 15 දින ලියාපදිංචි වෛද්‍ය නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. එසේම අනුමත ස්ථිර තනතුරු 04 ක් සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගැනීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු බඳවාගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්යමණ්ඩලයට අනුව රෝහලේ සේවය කළ යුතු වෛද්‍යවරු සංඛ්‍යාව 28 වන නමුත් තත්‍ය වශයෙන් සිටින්නේ 19 ක් බව, පුවත්පත් දැන්වීම් පළකර වෛද්‍යවරුන් බඳවාගැනීමට උත්සාහ කළ නමුත් ඒ සඳහා සුදුසු වෛද්‍යවරුන් අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණු බව, රෝගී සත්කාර සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට අනුමත ලියාපදිංචි වෛද්‍යවරු තනතුරු සංඛ්‍යාව ඉක්මවා එක් ලියාපදිංචි වෛද්‍යවරයෙකු බඳවා ගැනීමට සිදු වූ බව, ස්ථිර පදනමින් රෝහලේ පුරප්පාඩු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ඇති නිලධාරීන් බඳවා ගැනීමට උත්සහ දැරුවද එම අවශ්‍යතාවයන් සපුරන මට්ටමේ නිලධාරීන් නොමැති බැවින් අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත විශ්‍රාමලත් නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සිදුවී ඇති බව, රෝහලේ රෝගී සත්කාර සේවය හා පරිපාලනමය කටයුතු අඛණ්ඩව සිදු කළ යුතු බැවින් මෙලෙස ක්‍රියා කිරීමට සිදුවී ඇති බව හා රෝහල තුළ සේවය කරන සුදුසු නිලධාරීන් මෙම තනතුරු වලට උසස් කිරීම සඳහා පුහුණු කිරීමේ කටයුතු සිදු කරගෙන යන බව. | රෝහල් කාර්ය මණ්ඩලය සඳහා නව තනතුරු ඇති කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. එසේම ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමට උත්සාහ කළ යුතුය. |
| (ආ) | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නමින් නව තනතුරක් ඇති කර එම තනතුර සඳහා 2019 සැප්තැම්බර් මාසයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස 27 කදී දීමනා ලෙස රු.965,000 ක් ගෙවා තිබුණි. | ස්ථිර පදනමින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරක් අනුමත කරගෙන බඳවා ගැනීමට වඩා මෙය ආර්ථිකමය වශයෙන් වාසිදායක වන බව, එලෙස නිලධාරිනියක් රෝහලට බඳවා ගෙන දිනපතා පූර්ණකාලීනව සිදු කිරීමට කාර්යයක් නොමැති බව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධීකරණය හා අදාළ වාර්තා තබාගැනීමේ කටයුතු පමණක් මෙම නිලධාරිනිය මඟින් සිදු කරගන්නා බව හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත බඳවා ගැනීම සිදු කර ඇති බව. | රෝහල් කාර්ය මණ්ඩලය සඳහා නව තනතුරු ඇති කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු අතර එවැනි අනුමැතියකින් තොරව බඳවාගැනීම් සිදුකිරීමට හෝ දීමනා ගෙවීමට කටයුතු නොකළ යුතුය. |